'හුස්ම' කෙටිකතා සංග්‍රහය

කතෘ: ලක්ෂමන් කොඩිතුවක්කු

රංජිත් ධර්මකීර්ති

ස්වකීය කෙටිකථා සංග්‍රහයට පෙරවදනක් සපයන ලක්ෂමන් කොඩිතුවක්කු, ''සෑම යුගයකම සාහිත්‍යකරුවා තුළින් කෙරෙන්නේ තම නිර්මාණ මගින් ජනතාව හා සම්බන්ධ වන එක්තරා භූමිකාවක්ය යන්න මගේ හැඟීමයි. ඔහු ජනතාව අතරම සෙවනැල්ලක් මෙන් සිටින, ඔවුන්ගේ ආත්මය හා බැඳෙන නිර්මාණශීලී සත්‍යවාදියෙකි'' යි පවසයි. ''මිනිසා දේශපාලන සත්වයෙකි'' යි ඇරිස්ටෝටල් පඬිවරයා කී මතය ද අපට මෙහිදී සිහිපත් වේ. සැබැවින්ම ජනතාව අතර ජීවත් වන සාහිත්‍යකරුවා ගේ වගකීම වන්නේ තම නිර්මාණ තුළින් පාඨකයන් හට චින්තනයක් ලබා දෙන අතරම එය ප්‍රඥාසම්පන්න චින්තනයක් බවට පත් කරමින් ඔවුන්ට නො පෙනෙන කටුක යථාර්ථය කෙරෙහි ජනතාවගේ දෘස් විවර කිරීමය. එවිට තමන් වැටී ඇති අනාධය වටහා ගන්නා ජනතාව සමාජයේ ගමන් මග වෙනස් කිරීමට යොමුවෙනු ඇත. යථාර්ථවාදී දෘෂ්ටිය මත පිහිටා ස්වකීය නිර්මාණ බිහි කළ මහා රුසියානු ලේඛකයන් ගේ උපාය මාර්ගය හා දර්ශනය වූයේ ද එයයි.

එහෙත් කහගාටුවට කරුණ නම් වර්තමාන ශ්‍රී ලාංකික ලේඛකයන් ගෙන් බහුතරයක් දියුණු ධනේශ්වර රටවල ජනප්‍රිය වූ පශ්චාත් නූතන වාදය වැනි රීතීන් ඔස්සේ හඹා යමින් තම නිර්මාණ තුළින් අතාත්වික හරබ ඉදිරිපත් කරමින් පවතින සංජානයට නතු නොවන, සාධනය ජනතාවට කියවා තේරුම් ගත නොහැකි මතිභ්‍රමයන් නිර්මාණ ලෙස ඉදිරිපත් කිරීමට පෙළඹී සිටිමයි. ලක්ෂමන් කොඩිතුවක්කු පවසන පරිදිම ''නිවසේ මුළුතැන්ගෙයි අහුමුල්ලේ සැඟව ඇති ලුණු බිංදුව පවා දේශපාලනීකරණය වී ඇති යුගයක සාහිත්‍යකරුවාට දේශපාලනය වදනින් ඈත්වී නිර්මාණ බිහි කිරීමට නොහැකි'' යුගයක දේශපාලන බලාධිකාරයේ විඳුලි සැර වැදෙමින් ජීවන බරින් පරිපීඩිත වූ ජනතාව අන්ත අසරණ තත්වයකට පත්ව සිටින මොහොතක යථාර්ථය හෙවත් මඟපොළව දෙස නොබලා අහස දෙස තෙත් යොමාගෙන නව මෝස්තරවාදී නිර්මාණ නැමැති සරංගල් අහසේ පා කරමින් තෘප්ත වන නූතන බහුතර ලේඛක පිරිසට කොඩිතුවක්කු 'හුස්ම' කෙටිකතා සංග්‍රහයෙන් අභියෝගයක් එල්ල කරයි. ඕස්ට්‍රේලියාව වැනි දියුණු රටක, ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන රටක, ඉතා සුවපහසු දිවියක් ගෙවන ලක්ෂමන් කොඩිතුවක්කු වැනි ලේඛකයෙකුට පහසුවෙන්ම තමා උපන් රටේ ජනතාවගේ දුක්ඛ දෝමනස්සයන් ගෙන් අන්ධ වී සිටිය හැකි නමුත් ඔහු මෙම කතා සංග්‍රහයේ එන සෑම කෙටිකතාවකින්ම පාහේ නූතන ශ්‍රී ලාංකික ජනතාව, විශේෂයෙන්ම දුගී දුප්පත් ජනතාව පත්වී ඇති බිහිසුණු යථාර්ථය ප්‍රචාරකවාදී නොවී, මැදහත් දෘෂ්ටියකින් හෙළි කිරීම මෙම කෙටිකථා සංග්‍රහයේ වැදගත්ම ලක්ෂණයක් ලෙස පෙන්වා දෙනු කැමැත්තෙමි.

කෙටිකථා එකොළොසකින් සමන්විත මෙම කථා සංග්‍රහයේ එන 'හුස්ම' නමැති සූක්ෂ්ම නිර්මාණය වර්තමාන උගත් ශ්‍රී ලාංකික ශිෂ්‍ය පරම්පරාව තේමා කොට ගන්නකි. කනිෂ්ක රැකියා ඉල්ලා සටන් වදින ශිෂ්‍ය උද්ඝෝෂණ ව්‍යාපාරවලට සම්බන්ධ වෙයි. ඔහුගේ මවත් නැගණියත් ගෙවන දුෂ්කර ජීවිතයෙන් ගොඩගත හැකි එකම පුද්ගලයා තමා වන බැවින් ඔහු කෙසේ හෝ රැකියාවක් සොයා ගැනීමට උත්සාහ ගනී. පත්තර පිටුවක තිබූ දැන්වීමක් දැක 'පන්දමකින්' නොරව රැකියාවක් ලබා ගත හැක්කේ පොද්ගලික ඇංශයෙන් පමණක් යැයි සිතන කනිෂ්ක ද එම ආයතනය වෙත යයි. එහෙත් එය මිනීපෙට්ටි සාප්පුවකි. එහි අයිතිකාර මුදලාලිට අවශ්‍ය වන්නේ ජනතාව සූරාකෑමේ කලාව හොඳින් දන්නා තරුණයකු ඊට සම්බන්ධ කර ගැනීමයි. එහෙත් කනිෂ්ක සිහමනට වැටුණත් තම ආත්මය මුදලට පාවා දෙන අයෙක් නොවේ. මෙම කථාවේ දී රචකයා කනිෂ්කගේ කථාව කීමට වඩා ඔහුගේ අධ්‍යාත්මය දැකීමට ගත් උත්සාහය වැදගත්ය. මුදලාලිගේ සාප්පුවේ තරප්පු පෙළින් බිමට බැසීමත් සමගම කථාවේ සියළු පැති හෙළි පෙහෙළි වී අවසාන හමුත් රචකයා ඉන් එහාට ද කථාව ඇදගෙන යාමට උත්සාහ නොගත්තේ නම් වඩාත් යෙහෙකැයි සිතමි.

ශ්‍රී ලාංකික ශිෂ්‍ය ප්‍රජාවගේ ගැටළු තේමා කර ගනිමින් 'හුස්ම' ලියූ කොඩිතුවක්කු, එම ප්‍රශ්නවලින් මිදීමට එතර වූ තරුණයකුගේ ප්‍රශ්න තේමා කර ගනිමින් 'එතර වීම හා ගල් වූ තරුණයකුගේ කතාවක්' නමැති අපූරු නිර්මාණය තම සංග්‍රහයට ඇතුළත් කරයි. අම්මා ඉඩමත් උගස් කර දුන් මුදලින් ඕස්ට්‍රේලියාවේ විශ්ව විද්‍යාලයකට ඇතුළත් වූ අරුණ ගේ එකම අපේක්ෂාව අම්මාට බරක් නොවී මුදල් අතට ගෙවන සුළු සුළු රැකියාවල් කරමින් ඉන් උපයාගන්නා මුදලින් යැපෙමින් උපාධිය සමත් වීමයි. ඔහු තම මිතුරෙකු වන සුජීව සමග එක කාමරයක වෙසෙමින් ගත කරන ජීවිතය දෙස කතුවරයා බලන්නේ හාස්‍ය හා උත්ප්‍රාසය මතු කරමිනි. දේශන නිසා රැකියාවට කලට වේලාවට යා නොහැකි වූයෙන් කරමින් සිටි රැකියාව ඔහුට අහිමි වෙයි. දැන හැඳුනුම් මාර්ගයෙන් ඔහු මෝටර් රථ 'ක්ලිනින් ඇන්ඩ් වැක්‍යුම් සර්විස්' කරන තැනක වැඩක් අල්ලා ගනී. බර වැඩවලට අමතරව ගනු දෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමට ඔහුට බෝඩ් ලෑල්ලක් පිටේ බැඳගෙන වීදියේ ඇවිදීමට ද සිදුවෙයි. සුභද්‍රක්කාගේ 'සිංහල/දෙමළ' කඩේ තවත් වැඩක් ද අල්ලා ගනී. එහිදී හමුවන ලීසා නමැති තනිව වෙසෙන තරුණියගේ උදව්වෙන් ඔහු නත්තල් කාලයේ ගනු දෙනුකරුවන් අද්දවා ගැනීමට නත්තල් පප්පාගේ ඇඳුමෙන් සැරසී උසුළු විසුළු පාන අයෙකුගේ රැකියාවක් ද ලබා ගනී. දැන් අම්මාට බරක් නොවී පාඩමාලා ගාස්තුව යන්නමින් සොයා ගත හැකිය. ඒ සඳහා බර වැඩකාරයකු විය යුතුය. තුනපහ කඩේ වැඩ කළ යුතුය. නත්තල් පප්පාගේ භූමිකාව රඟමින් උසුළු විසුළු පෑ යුතුය. මේ සියළු උසුළු විසුළුල තුළින් ධීවතිත වන්නේ දියුණු රටක උපාධියක් ගැනීමට ශ්‍රී ලාංකික තරුණයන්ගේ දුක් වේදනාවන් නොවේද? මනා ඛස් වහරකින් හා නව්‍ය වූ උපමා රූපක තුළින් කොඩිතුවක්කු මෙම උත්ප්‍රාසය වඩාත් තීව්‍රව කරයි. මෙය කථා සංග්‍රහයේ වන ඉතා හොඳ කථාවකි. එසේම කැළණි ගඟේ වැලි ගොඩ දමන පියෙකුගේ පුතකු වන සුමනෙ, රත්රන් එකතු කරමින් පොහොසත් වීමට මාන බලමින් සිහින ලොවක ජීවත් වන නමුත් කටුක යථාර්ථය, ගං දිය මුහුදට ගලන්නා සේම ඔහුගේ ප්‍රාර්ථනා සමතලා කර දමයි. අවසානයේ තම සෙනෙහෙබර බිරිඳ, ජයන්ති ගඟෙන් එගොඩ අළුත ඉදි වූ වැලි මුදලාලිගේම හෝටලයේ ගනිකාවක් බවට පත්වීම දැරා ගත නොහී ගඟටම බිලිවන සැටි දැක්වෙන 'සිහින විකිණීමට තිබේ' කෙටිකථාව බස මෙන්ම ප්‍රබල සංකේත භාවිතයෙන් ද අනූන අපූරු කතාවකි.

'බැමි', 'වෙඩි තියාගත්තට පස්සෙ' මෙම කතා සංග්‍රහයේ එන තවත් හොඳ කතා දෙකකි. ලුප්පත්, අවංක විශාමික ගුරුවරයෙකු දේශපාලනයේ පරිපීඩනය, අඟහිඟකම්, දරුවන් දිග දිමට නොහැකි වීම ආදී දහසකුත් ප්‍රශ්න මැද හුදෙකලා වෙයි. රටේ පරිහානිය නිසා ඔහු තැනූ සාරධර්ම සුරකින ගෝලයන්ගේ ලෝකය ද බිඳ වැටී ගොසිනි. සියලු අපේක්ෂාවන් ඉටු නොවුණු තැන හොර අරක්කු විකුණන තම ගෝලයාට තම පරාජය-එය සමාජයේම පරාජයකි- පවසා අරක්කු කාලක් ද බී දිවි නසා ගන්නා සැටි කියැවෙන මෙම කථාවේ ආකෘතිය ද වෙනස්ය. එය 'රණ්මොන්' කථාව සිහි ගන්වන නමුත් ලාංකික යථාර්තය මැනවින් කියා පෑමට කොඩිතුවක්කු එම ආකෘතිය අපූරුවට යොදාගෙන ඇත.

මෙම කථා සංග්‍රහය තුළින් ලක්ෂමන් කොඩිතුවක්කු දිග ගමනක් යා හැකි සමාජ යථාර්ත මැදහත් සිතින් විවරණය කරමින් චරිත මෙහෙයවන ලේඛකයකු බවට පත්වී ඇති වග අවසනව පවසනු කැමැත්තෙමි.

කල්දෙමුල්ල ගේ සටහනක්

මාධ්‍යයට එන්න සුවපහසු ස්ථානය

RCB FILM PRODUCTION

රොබින් බොස්කෝ

Robin bosco

ප්‍රාසංගික කලාවත්, ශ්‍රී ලාංකීය හඬ හා හැඩ ගැන කතා කරන මොහොතක් වේ නම් ඒ අතරට අමතක නොවන නිර්මාණකරුවකුයි අද අප මුණගැහෙන්නේ. ඕස්ට්‍රේලියානු ශ්‍රී ලාංකික ප්‍රජාව සමග එක්ව කටයුතු කරමින් අපේ කමත් රැගෙන නිර්මාණශීලී දායකත්වය ලබාදෙන පිරිස් අතරේ සිඩ්නි නුවර "රොබින් බොස්කෝ" යන නාමය පෙරමුණේ ඉන්නා බව කවුරුත් දන්නා කරුණක්.

අවු 15ක් මුළුල්ලේ ප්‍රජාවට අනුපමේය සේවාවක් ලබාදෙමින් විවිධ මාධ්‍ය හා සම්බන්ධ වෙමින් ජායාරූපකරණයෙන්, වීඩියෝකරණයෙන්, නිෂ්පාදන අධ්‍යක්ෂණයෙන්, හා සංස්කරණයෙන් මනා නිර්මාණ නිමැවුම් ලබාදෙන ඔහු RCB FILM PRODUCTION නමින් මාධ්‍ය ආයතනයක් ද කරගෙන යනු ලබනවා.

වෘත්තීයෙන් ගණකාධිකාරීවරයකු වූ ඔහු සැබැවින්ම විවිධ කුසලතාවන්ගෙන් සපිරි නිර්මාණකරුවෙකි. කාලයක සිට ශ්‍රී ලාංකික ප්‍රජාවේ උන්නතිය උදෙසා එදිනෙදා තොරතුරුත් ලොව දසදෙස තොරතුරුත් තාක්ෂණයෙන් සපිරි rcbtv.org නමින් වෙබ් අඩවියක් කිසිදු අයකිරීමකින් තොරව ප්‍රජාව වෙනුවෙන් ම සියළු රස කලස බෙදමින් ඔහු එසින් ම පවත්වාගෙන යනු ලබනවා.

සිඩ්නි නුවර ප්‍රථම ශ්‍රී ලාංකික රූපවාහිනී වැඩ සටහනක් ඕස්ට්‍රේලියානු රූපවාහිනී නාලිකාවක වීඩියෝකරණයෙන්, නිෂ්පාදන වැඩ සටහන් අධ්‍යක්ෂණයෙන්, හා සංස්කරණයෙන් අලංකාරයක් කලේ "රොබින් බොස්කෝ"යි. සිඩ්නි හි ප්‍රාසංගික කලාවට මුල් තැන දෙමින් වසරක් පාසා පැවැත්වෙන සිංහල සංස්කෘතික හමුව මගින් පවත්වනු ලබන "බක්මහ රංගන" දැවැන්ත වූ ප්‍රසංගයේ ප්‍රථම වරට එළි දැක්වූ DVD තැටිය ද මනා පෙළගැස්මෙන් හා තාක්ෂණයෙන් සමන්විතව සකස්කර දුන් ඔහු සිඩ්නි නුවර ශ්‍රී ලාංකිකයිනට "බක්මහ රංගන" ප්‍රසංගයේ අලංකාරය සිංහල සංස්කෘතික හමුවේ පිරිසේ එකමුතුවෙන් නැවත හැවතත් පෙන්වා දුන්නා.

ප්‍රාසංගික කලාවට යමක් එක් කරන්නට රොබින් ද වසර කිහිපයකට පෙර භාතිය හා සන්තුෂ් ප්‍රසංගය සිඩ්නි ශ්‍රී ලාංකිකයිනට පිළිගැන්වූවා, ඉරාජ් හා රණිඳු ගේ "අහංකාර නගරේ" මෙන්ම "කැළණි පාලම", බිල්ලොත් එක්ක බෑ වැනි වෙදිකා නාට්‍යයන් ද ඔහු ශ්‍රී ලාංකිකයිනට පිළිගැන් වූ තවත් ලාංකීය රස පූර්ණ නිර්මාණයන්. ශ්‍රී ලංකා රූපවාහිනියේ දිනු කාලයක සිට ළමා සිතුම් පැතුම්,දක්ෂතා වලට අත්වැල දෙමින් ප්‍රචාරය වන "මුතුහර" ළමා වැඩ සටහනේ ඔහු ගේ දායකත්වමද හිඩැඳවම සිදුවන්නක්.

ඕස්ට්‍රේලියානු සිහල ළමා පරපුරේ රැකුම්,වැයුම් දක්ෂතා පෙළගස්වමින් වීඩියෝකරණයෙන්,නිෂ්පාදන වැඩ සටහන් අධ්‍යක්ෂණයෙන්, හා සංස්කරණයෙන් "මුතුහර" වැඩසටහනේ කොටසක් භාරව කරන්නට කාලය සැපසකරන්නේ ද ප්‍රජාවට කරනා තවත් විසල් සේවාවක් ලෙසින්.

සිය ඕරිඳ අයෙම් ඔස්නායක ගෙන්ද මේ කාර්යයන්ට ලැබෙන්නේ නොමඳ සහයකි. ඇය නිවේදිකාවක්, වැඩ සටහන් මෙහෙයවන්නියක්, සංවිධායකවරියක් මෙන්ම සිඩ්නි රසික ජනතද බැඳගත් දක්ෂ ගායිකාවකි. කොබෝ දිනසින් විකාශනය වන්නට සියමිත ටෙලිනාට්‍ය කිහිපයකම රංගනයෙන් ඇය සහභාගී වී ඇත.

මේ දෙපොළ ගේ දායකත්වය හා සුසංයෝජනය ඕස්ට්‍රේලියානු ශ්‍රී ලාංකිකයින් අතරට ලැබීම මහඟු වාසනාවක් මෙන්ම ඔවුනගේ මේ ප්‍රජා සේවා කටයුතු අප අඟය කොට සැළසීම වටී. රොබින් බොස්කෝ විසින් නව වසරට තිළිණ කරන්නා වූ 2014 මාර්තු මස 15 වන සෙනසුරාදා සවස 7 ට සිඩ්නි හි බ්ලැක්ටවුන් බෝමෙන් ශාලාවේ දී භාතිය හා සන්තුෂ් ප්‍රමුඛ අගාන්ති,උමාරියා,රන්දීර සහභාගීත්වයෙන් රස ගැන්වෙන "සරා සිහින" වසරේ දැවැන්ත වූ ශී ප්‍රසංගයට සහභාගී වන්නට ඔබටත් පුළුවන්.

0406 171 721 මොබයිල් දුරකථනය ඔස්සේ හෝ rcbtv.org@gmail.com ඊමේලය ඔස්සේත් ඔබට විස්තර දැනගන්නට පුළුවන්. නිර්මාණ කලාව උදෙසා මෙවන් කාර්යභාරයකට උරදෙන්නා වූ නිර්මාණකරුවකුට සියළුම බලාපොරොත්තු සාර්ථක වන්නට ප්‍රාර්ථනා අපෙන් සුභ ප්‍රාර්ථනා! නොඅඩුවම

සිහිනයක් නොවී භාතිය හා සන්තුෂ් ප්‍රමුඛ අගාන්ති,උමාරියා,රන්දීර සහභාගීත්වයෙන් රස ගැන්වෙන "සරා සිහින" ප්‍රසංගයේ අලංකාරය ඔබටත් විඳින්නට අවස්ථාවක්